# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,094 - 2018 ඔක්තෝබර් මස 19 වැනි සිකුරාදා - 2018.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 690 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 691 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 නොවැම්බර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


689-B 081459— 353 (2018/10)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

කුරුණෑගල දිසා අධිකරණයේ දී ය

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
තැ.පෙ. 2085,
කොළඹ 02.

නඩු අංක : 1642/ MB
ඇස්කීසි අංක : 13/2018

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

ජයවර්ධන මුදියන්සේලාගේ රංජිත් ශාන්ත ලාල්,
''තිස්ස ස්ටෝර්ස්'' බාරේ,
එබේ වත්ත, බමුණුස්ස, පැල්ලන්දෙණිය,
කුරුණෑගල.

...................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2017.10.13 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් අයවිය යුතු මුලික ණය ශේෂය වන වර්ෂ 2013.04.30 වැනි දින වන විට අයවිය යුතු මුලික ණය ශේෂය වන රුපියල් හයලක්ෂ අසූහයදහස් හාරසිය තුනයි ශත හැටක් (රු.686,403.60) සහ 2013.05.01 වැනි දින සිට එකී රුපියල් හයලක්ෂ අසූහයදහස් හාරසිය තුනයි ශත හැටක් (රු. 686,403.60) මුදල මත වාර්ෂිකව 14% ක් වූ පොළියක් ද එකී දින සිටම විත්තිකරු විසින් නිසි පරිදි වාරික නොගෙවීම මත එකතු වී ඇති හිඟ වාරික මුදල් වන රුපියල් දෙලක්ෂ හතලිස් පන්දහස් පන්සිය පනස් හතයි ශත විසි දෙකක (රු. 245,557.22) මුදලක් ද 2013.05.01 වැනි දිනට එකී හිඟ වාරික මුදල් සඳහා මාසිකව එකතු වී ඇති 2% බැගින් වූ අමතර පොළිය වන, රුපියල් හැත්තෑඑක්දහස් පන්සිය දහඅටයි ශත හැට අටක (රු. 71,518.68) මුදලක් ද ඉහත කී රුපියල් දෙලක්ෂ හතලිස් පන්දහස් පනස් හතයි ශත විසි දෙකක (රු. 245,557.22) මුදල ගෙවා අවසන් වන තුරු එකී මුදල මත මාසිකව 2% ක පොළිය ද මෙම නඩුවේ තීන්දු ප්‍රකාශයේ දින සිට අදාළ සම්පූර්ණ මුදල ම අයකර ගන්නා දිනය තෙක් එකී සම්පූර්ණ මුදල මත නෛතික පොළියද නඩු ගාස්තු ද, වෙන්දේසි ගාස්තු ද අයකර ගැනීම සඳහා කුරුණෑගල දිසා අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් අයි. උඩුවිල ආරච්චි විසින් තහනමට ගෙන ඇති එකී විත්තිකරුවන්ට අයත් මෙහි පහත උපලේඛණයේ සඳහන් නිශ්චල දේපළ වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 15 වැනි දින ප.ව. 1.00ට අදාළ දේපළ පිහිටි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩ විල්ලි හත් පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 788 හෙට්ටිගෙදර ග්‍රාම නිළධාර වසමේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බමුණුස්ස ගමේ අංක 56/2003A හා 2003.02.15 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 33 දරන එබේ එස්ටේට් නමැති ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩ විල්ලි හත් පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 788 හෙට්ටිගෙදර ග්‍රාම නිළධාරී වසමේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බමුණුස්ස ගමේ පිහිටි එබේ එස්ටේට් නමැති ඉඩමට වන දින එම්. ඩබ්. ආරියරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංකඃ 56/2003A පිඹුර ප්‍රකාර කැබලි අංක 33 කොටසට මායිම්, උතුරට ඃ කැබලි අංක 19ද, නැගෙනහිරට ඃ කැබලි අංක 13 (අඩි 20ක් පළල පාර), දකුණට ඃ කැබලි අංක 36 සහ බටහිරට ඃ කැබලි අංක 32 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහලවක (අක් 0, රූඩ් 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ පලතුරු ආදී සියළු දේ ද සමග පිඹුරු අංක 56/2003 A හි කැබලි අංක 13 (අඩි 20ක් පළල පාර) සහ කැබලි අංක 9 (අඩි 30ක් පළල පාර) සහ එම්. ඩබ්. ආරියරත්න මානක තැන සම්පාදිත අංක 55/2003 A සහ 2003.02.15 දිනැති පිඹුරේ නිරූපිත පාරවල් පොදුවේ පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතියද සමඟ වේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1531/59 හි ලියාපදිංචි කර ඇත.

ටී. එන්. කුලසේකර,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
සාම විනිසුරු,
කුරුණෑගල.

වර්ෂ 2018ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින දී ය.

10-1192

# විවිධ දැන්වීම්

## කැළණිය බෞද්ධ කාන්තා පුණ්‍ය ආයතන සමිතිය පනත සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූජ්‍ය අතුරලියේ රතන හිමි වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53(1) යටතේ කැළණිය බෞද්ධ කාන්තා පුණ්‍ය ආයතන සමිතිය පනත සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී කැළණිය බෞද්ධ කාන්තා පුණ්‍ය ආයතන සමිතිය සංස්ථාගත කිරීමයි :-

(1) ප්‍රාථමික අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාලය දක්වා අඩු ආදායම්ලාභී බෞද්ධ පවුල්වල අනාථ අත්හල දියණිවරුන්ගේ අධ්‍යාපනය, සාරධර්ම, සංස්කෘතික කටයුතු නංවාලමින්, රැකවරණය දෙමින්, වැබඩ කිරල්ලවල ජය මාවත 307/16 දරන ස්ථානයේ සෙනෙහස ළමා සංවර්ධන මධ්‍යස්ථානය නමින් ''සෙනෙහස දැරි සෙවන ළමා නිවාසය'' පවත්වාගෙන යාම,

(2) ගම්පහ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් තෝරා ඔවුන්ගේ අධ්‍යාපනය, කුසලතා නංවාලීමට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම්, වෘත්තීය නිපුණතාවයන් ලබා ගැනීමට මග පෙන්වීම හා මූල්‍යාධාර ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම,

(3) සියලු දෙනාම සඳහා බුදු දහම අවබෝධ කර දීම සඳහා සහ බුදු දහම ලෝකය පුරා පැතිරවීමට අවශ්‍ය සියලු පියවර ගැනීම,

යනාදිය වේ.

පූජ්‍ය අතුරලියේ රතන හිමි,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-1190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.